# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

2013 ජූනි මස 28 වන දින

**II** වන කොටස

අතිරේකය

(2013.07.01 දින නිකුත් කරන ලදී.)


# පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන)

*(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)*

**පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝසි සේනානායක මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 3.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක    දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

22 (4) (2ආ) වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2012 අංක 22 දරන පනතේ 22 (4) (2ආ) වගන්තිය, සම්පූර්ණ උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කරමින් සංශෝධනය කළ යුතු ය:—

> "මේ ආඥා පනතේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයේ සඳහන් මුළු අපේක්ෂක සහ අමතර තැනැත්තන් සංඛ්‍යාවෙන් සියයට 30 කට නොඅඩු සංඛ්‍යාවක් කාන්තාවන්ගෙන් සමන්විත විය යුතු අතර, එකී සංඛ්‍යාවෙන් සියයට 20 කට නොඅඩු සංඛ්‍යාවක් තරුණයන්ගෙන් සමන්විත විය යුතු ය."

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.